එන්න මගේ පියාණගේ නිවස තුළට දැන්

රැකෙන මගක් නැති වුනි එයට සෙතක් ලැබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුළට දැන්

## 165 – පණතක් මම

පණතක් මම ඔබට දෙමි – පෙම් දක්වනු සැමට නිතින්
මා කලසේ නිති දිනයේ – පණ පුදමි කුරුස ගසේ

දයාම වන්නේ ඉවසීමයි
සැම හට දක්වන ආදරයයි
හදවත් පිබිදෙන කරුණවයි
ගුණවත් ගතියේ ජීවනයයි

දයාව ඇති තැන උඩඟු නොවේ
සිතුදේ කලදෙහි උදම් නොවෙයි
නොහොබින සැමගති ඉවත දමයි
ඉසිකෝ දුර්ගුණ සිඳ බිඳ ලයි

දයාව සැමහට කමා කරයි
නිසිදේ කෙරෙහි සතුට වඩයි
තම තම ලාබය සොයා නොයයි
සාමය සැමවිට ළඟා කරයි

දයාව වන්නේ ඇදහීමයි
ආසිරි වඩවන මතු දැක්මයි
වරදක් නොදකින තුටු බැල්මයි
හොඳ හිත නොබිඳෙන සුබ වදනයි